අ.පො.ස. සාමාන්‍ය පෙළ

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

# Business and Accounting Studies

## ප්‍රවාහන සේවා


සැකසුම හා ඉදිරිපත් කිරීම:-

**ධම්මික හෙට්ටිආරච්චි**

0776530215

- ප්‍රවාහන සංකල්පය
- ප්‍රවාහනයේ මූලිකාංග
  - ➤ මාධ්‍යය
  - ➤ මාර්ගය
  - ➤ බලය
  - ➤ පර්යන්තය
- සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරාගැනීමේදී ව්‍යාපාර විසින් සලකා බලන සාධක
  - ➤ පිරිවැය
  - ➤ ධාරිතාව
  - ➤ සුලබත්වය
  - ➤ වේගය
  - ➤ ආරක්ෂාව
- ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රවාහනය දායක වන ආකාර
- විවිධ ප්‍රවාහන ක්ෂේත්‍ර හා එහි වාසි/අවාසි
  - ➤ මහාමාර්ග
  - ➤ දුම්රිය මාර්ග
  - ➤ ගුවන් මාර්ග
  - ➤ ජල මාර්ග

**සංකල්ප සිතියම (Concept Map)**



# ප්‍රවාහන සේවා (Transportation)



❖ **ප්‍රවාහනය;**

- යම්කිසි ස්ථානයක සිට තවත් ස්ථානයකට භාණ්ඩ හා මගීන් ගෙනයාම ප්‍රවාහනය ලෙස හඳුන්වයි.

**නැතහොත්,**

**ප්‍රවාහන සංකල්පයෙන් අදහස් කරන්නේ අවකාශය තරණය කිරීම යන්නයි.**

ධම්මික හෙට්ටිආරච්චි

# ❖ ප්‍රවාහනයේ මූලිකාංග.

- ප්‍රවාහන ක්‍රමයක කාර්යක්ෂමතාව ඇති කිරීමට ඉවහල් වන්නා වූ සාධක සමූහයක් ප්‍රවාහන මූලිකාංග ලෙස හැඳින්වේ. මෙම මූලිකාංග සංවර්ධනය වීම නිසා ප්‍රවාහනයේ දියුණුවක් ඇතිවෙයි.

**ප්‍රවාහන මූලිකාංග**

- මාර්ගය
- මාධ්‍යය
- බලය
- පර්යන්තය

# මාර්ගය (THE WAY)

- ප්‍රවාහන කටයුතු සඳහා යොදාගන්නා විවිධ මාවත් මින් අදහස් වේ.

**නිදසුන්**

- මහා මාර්ග.
- දුම්රිය මාර්ග.
- ජල මාර්ග.
- ගුවන් මාර්ග.

**සමහර මාර්ග මිනිසා නිර්මාණය කරයි. සමහර මාර්ග ස්වාභාවික ඒවා වේ.**

ධම්මික හෙට්ටිආරච්චි




- විවිධ ප්‍රවාහන මාර්ගවල ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා යාන වාහන, මාධ්‍ය වශයෙන් හැඳින්වේ.

| මාර්ගය | මාධ්‍යය |
|---|---|
| • මහා මාර්ග | කරත්ත, පාපැදි, යතුරු පැදි, ත්‍රී රෝද රථ, කාර්, වැන්, බස්රථ, ලොරි |
| • දුම්රිය මාර්ග | විදුලි දුම්රිය, ඩීසල් දුම්රිය, වාෂ්ප දුම්රිය |
| • ජල මාර්ග | ඔරු, පාරු,බත්තල්, බෝට්ටු, නැව් |
| • ගුවන් මාර්ග | ගුවන් යානා, හෙලිකොප්ටර් |

# බලය (Power)

✓ **ප්‍රවාහන මාධ්‍යය ධාවනය කිරීමට භාවිතා කරන ශක්තීන්, බලය ලෙස හැඳින්වේ**

**නිදසුන්**

- මිනිස් ශ්‍රමය.
- සත්ව ශ්‍රමය.
- ගල් අඟුරු.
- ඛනිජ තෙල්.
- ගෑස්.
- සූර්ය බලය.
- විදුලිය.
- සුළඟ.

ධම්මික හෙට්ටිආරච්චි

# පර්යන්තය (TERMINALS)

✓ **ප්‍රවාහන මාධ්‍යය හැසිරවීම සඳහා භාවිතයට ගන්නා ස්ථානය පර්යන්තය හෙවත් නැවතුම්පොල ලෙස හැඳින්වේ.**

**නිදසුන්**

- බස් නැවතුම්පොළ.
- වරාය.
- දුම්රිය නැවතුම්පොළ.
- ගුවන් තොටුපොළ.






ධම්මික හෙට්ටිආරච්චි

✓ සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක.

## භාණ්ඩයේ ස්වභාවය

- **භාණ්ඩයේ ස්වභාවය අනුව තෝරාගන්නා ප්‍රවාහන මාධ්‍යය වෙනස් වේ**

**නිදසුන්**

- ඛනිජ තෙල් ප්‍රවාහනය සඳහා බවුසර යොදා ගැනීම.
- ඉක්මනින් නරක් වන භාණ්ඩ සඳහා ශීතාගාර පහසුකම් ඇති ලොරි යොදා ගැනීම.

ධම්මික හෙට්ටිආරච්චි

# ප්‍රවාහන පිරිවැය

- **ප්‍රවාහන මාධ්‍යය භාවිතා කිරීම වෙනුවෙන් දැරීමට සිදුවන වියදම මින් අදහස් වේ. ප්‍රවාහන පිරිවැය ඉහළ යාම භාණ්ඩයේ මිල වැඩිවීමට හේතු වෙයි.**

**නිදසුන්**

- විශාල ඇහලුම් තොගයක් ඇත රටකට යැවීම සඳහා ගුවන් ප්‍රවාහන ක්‍රමය වෙනුවට නැවක් මගින් ප්‍රවාහනය කිරීම.
- යාපනයට ඛනිජ තෙල් ප්‍රවාහනය සඳහා බවුසර් වෙනුවට දුම්රිය යොදා ගැනීම.

ධම්මික හෙට්ටිආරච්චි

## ▶ ධාරිතාව

- **භාවිතා කරන මාධ්‍ය මගින් එක් වරකදී රැගෙන යා හැකි මගීන් හෝ භාණ්ඩ ප්‍රමාණය ධාරිතාව යන්න අදහස් කෙරේ.**

### නිදසුන්

- කොළඹ වරාය සිට විශාල රෙදි තොගයක් කටුනායක පිහිටි ඇඟලුම් කම්හලකට ප්‍රවාහනය කිරීමට කන්ටේනර් ප්‍රවාහනය කළ හැකි වාහනයක් යොදා ගැනීම.
- ආපනශාලාවකට වෙළඳපොලෙන් එළවළු ප්‍රවාහනය කිරීමට ත්‍රීරෝද රථයක් යොදා ගැනීම.

ධම්මික හෙට්ටිආරච්චි

## ▶ වේගය

- **ව්‍යාපාරිකයා තම ප්‍රවාහන කටයුතු කෙතරම් ඉක්මනින් ඉටුකරගත හැකිද යන්න සොයා බැලිය යුතුය.**

## නිදසුන්

- ප්‍රාදේශීය රෝහලක ප්‍රතිකාර ලබමින් සිටින රෝගියකු හදිසි ශල්‍යකර්මයක් සඳහා පහසුකම් ඇති රෝහලක් වෙත ගෙන යාමට ගිලන් රථයක් යොදා ගැනීම.
- ව්‍යාපාරිකයෙකුට ව්‍යාපාර කටයුත්තකට විදෙස්ගත වීමට ගුවන් පවාහනය යොදා ගැනීම.

ධම්මික හෙට්ටිආරච්චි

▶ ආරක්ෂාව

- මගීන්ට මෙන්ම ප්‍රවාහනය කරන භාණ්ඩවලට ඇති සුරක්ෂිත බව මින් අදහස් කෙරේ.

නිදසුන්

- වටිනා දියමන්ති තොගයක් විදේශ රටකට ඉක්මනින් ආරක්ෂාකාරි ලෙස යැවීමට ගුවන් යානයක් යොදා ගැනීම.
- රෝගියකු රෝහලක් වෙත ගෙන යාමට ගිලන් රථයක් යොදා ගැනීම

ධම්මික හෙට්ටිආරච්චි

## ▶ සුලභතාව

- ප්‍රවාහන මාධ්‍යයක් සපයා ගැනීමට ඇති පහසුව මෙයින් අදහස් වේ.

### නිදසුන්

- සාමාන්‍ය ජනයාට සාමාන්‍ය වියදමකින් ගමන් යාම සඳහා ත්‍රීරෝද රථය සුලභව යොදා ග
හැකි වීම.
- පොදු ප්‍රවාහන මාධ්‍යයක් ලෙස සුලබව බස් රථ යොදා ගත හැකි විය.

ධම්මික හෙට්ටිආරච්චි

## ➢ ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රවාහනය දායක වන ආකාරය.

- ★ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය සම්පත් කලට වේලාවට ලබාගැනීම.
- ★ සේවකයන් ප්‍රවාහනයට.
- ★ නිෂ්පාදිත කලට වේලාවට වෙළෙඳපොල වෙත බෙදාහැරීමට.
- ★ භාණ්ඩ පාරිභෝගිකයා වෙත ප්‍රවාහනයට.
- ★ මහා පරිමාණ නිෂ්පාදනයට රුකුලක් වීම.
- ★ කාලය ඉතිරි කර ගැනීමට.
- ★ වෙළෙඳපොල ප්‍රසාරණය වීම.
- ★ නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම.

ධම්මික හෙට්ටිආරච්චි

## විවිධ ප්‍රවාහන ක්ෂේත්‍ර

- **ව්‍යාපාරික කටයුතු ඉටු කර ගැනීම සඳහා යොදා ගන්නා විවිධ ප්‍රවාහන ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වේ.**

  - මහා මාර්ග.
  - දුම්රිය මාර්ග.
  - ජල මාර්ග.
  - ගුවන් මාර්ග.

ධම්මික හෙට්ටිආරච්චි

## ▶ මහාමාර්ග ප්‍රවාහනය

- **ගොඩබිම පිහිටි මාර්ග යොදාගනිමින් කරන ප්‍රවාහනය මෙයින් අදහස් වේ.**

**උදා:- A ශ්‍රේණියේ මහා මාර්ග**

A - 001 කොළඹ - මහනුවර
A - 002 කොළඹ - ගාල්ල
A - 003 කොළඹ - පුත්තලම
A - 004 කොළඹ - රත්නපුරය
A - 005 පේරාදෙණිය - බදුල්ල

## ▶ අධිවේගී මාර්ග

E01 - කොළඹ - මාතර
E01 - පිටත වටරවුම (කොට්ටාව - කෙරවලපිටිය)
E03 - කොළඹ - කටුනායක

ධම්මික හෙට්ටිආරච්චි

# දුම්රිය මාර්ග ප්‍රවාහනය

- භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සඳහා දුම්රිය මාර්ග යොදා ගනිමින් කරනු ලබන ප්‍රවාහන දුම්රිය මාර්ග ප්‍රවාහනය වේ.

## ශ්‍රී ලංකාව තුළ විහිදී ඇති දුම්රිය මාර්ග

- මුහුදුබඩ දුම්රිය මාර්ගය - කොළඹ කොටුව - මාතර.
- උතුරු දුම්රිය මාර්ගය - කොළඹ - කන්කසන්තුරේ.
- කැළණිවැලි දුම්රිය මාර්ගය - කොළඹ - අවිස්සාවේල්ල.
- පුත්තලම දුම්රිය මාර්ගය - රාගම - පුත්තලම.
- උඩරට දුම්රිය මාර්ගය - කොළඹ - බදුල්ල.
- නැගෙනහිර දුම්රිය මාර්ගය - කොළඹ - ත්‍රිකුණාමලය.

ධම්මික හෙට්ටිආරච්චි

# ගුවන් මාර්ග ප්‍රවාහනය

- භාණ්ඩ හා මගීන් ගුවනින් කරන ප්‍රවාහනය ගුවන් මාර්ග ප්‍රවාහනය නම් වේ. රටක අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහා මෙන්ම ජාත්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහාද ගුවන් මාර්ග ප්‍රවාහනය යොදා ගනී.

## ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගුවන් තොටුපලවල්

- රත්මලාන ගුවන්තොටුපල.
- කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ.
- මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ.
- පලාලි ගුවන්තොටුපොළ.

ධම්මික හෙට්ටිආරච්චි

# ජල මාර්ග ප්‍රවාහනය

- සාගර, ගංගා, ඇල මාර්ග ආදී ජල මාර්ග යොදාගනිමින් සිදුකරන ප්‍රවාහනයයි. රටක අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහා මෙන්ම ජාත්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහාද ජල මාර්ග ප්‍රවාහනය යොදා ගත හැකිය

## ශ්‍රී ලංකාවේ ප්‍රධාන වරායන්

- කොළඹ වරාය.
- ගාල්ල වරාය.
- කන්කසන්තුරේ වරාය.
- හම්බන්තොට වරාය.
- ත්‍රිකුණාමලය වරාය.

ධම්මික හෙට්ටිආරච්චි

| ප්‍රවාහන මාර්ගය | වාසි | අවාසි |
|---|---|---|
| මහාමාර්ග | • ගමනාන්තය දක්වා යොදාගත හැකි වීම.<br>• ඕනෑම වේලාවක යොදාගත හැකි වීම. | • මාර්ග තදබදය ඇතිවීම.<br>• මාර්ග අනතුරු සිදුවීම.<br>• පරිසර දූෂණයට බලපෑම. |
| දුම්රිය මාර්ග | • භාණ්ඩ හා මගීන් විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි වීම.<br>• මගී සුවපහසුව තිබීම.<br>• දුර ගමන් සඳහා විශේෂ සේවාවක් තිබීම.<br>• පිරිවැය අඩුවීම. | • ඇතැම්විට ගමනාන්තය දක්වා යොදාගත නොහැකි වීම.<br>• නියමිත කාල සටහනකට අනුව ධාවනය කිරීම නිසා මගීන්ට අවශ්‍ය වේලාවට යොදා ගත නොහැකි වීම. |
| ජල මාර්ග | • එකවර භාණ්ඩ හා මගීන් විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි වීම.<br>• ගුවන් ප්‍රවාහනයට වඩා ප්‍රවාහන ගාස්තු අඩු වීම. (පිරිවැය අඩු වීම)<br>• ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා පිටිවහලක් වීම.<br>• බරින් වැඩි දෑ ප්‍රවාහනය කළ හැකි වීම. | • භාණ්ඩ හා මගී ප්‍රවාහනයට දින ගණනාවක් ගත වීම.<br>• සෑම විටම යොදාගත නොහැකි වීම. (සාගර, ගංගා, ඇල මාර්ග නොමැති රටවල් හා ප්‍රදේශවලට යොදා ගත නොහැකි වීම) |
| ගුවන් මාර්ග | • වේගවත් බව.<br>• මගී සුවපහසුව වැඩිවීම.<br>• ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා පිටිවහලක් වීම. | • පිරිවැය අධික වීම.<br>• අනතුරකදී විනාශය වැඩි වීම.<br>• බරින් අධික ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම අපහසු වීම. |

ධම්මික හෙට්ටිආරච්චි

## අභ්‍යාස

01. ප්‍රවාහනය යනු කුමක්ද?

02. ප්‍රවාහනයේ මූලිකාංග නම්කරන්න.

03. සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක හතරක් සඳහන් කරන්න.

04. ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රවාහනය දායක වන ආකාර දෙකක් දක්වන්න.

05. ව්‍යාපාර කටයුතු ඉටුකර ගැනීම සඳහා යොදාගන්නා ප්‍රවාහන මාර්ග නම්කරන්න.

06. ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ සිදුවීම් කිහිපයකට නිදසුන් පහත දක්වේ. එම එක් එක් සිද්ධීන්ට අදාළ ප්‍රවාහන මූලිකාංගය නම්කරන්න.

(i) කොළඹ වරාය පුළුල් කිරීම.
(ii) ඩීසල්, පෙට්‍රල් හා භූමිතෙල් මිල පහළ දැමීම.
(iii) මාතර - කතරගම නව මාර්ගයක් ඉදිකිරීමට සැලසුම් කිරීම.
(iv) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ග්‍රාමීය ප්‍රදේශවල ධාවනය සඳහා කුඩා බස් රථ 200 ක් ආනයනය කිරීම.
(v) රථවාහන ධාවනය සඳහා බලය ලබාගැනීමට නව සූර්යබල පද්ධති හඳුන්වාදීම.
(vi) සියලු පහසුකම් සහිත නව දුම්රිය නැවතුම්පළවල් 2 ක් සැකසීම.
(vii) ගුවන් සමාගමක් විසින් නව ගුවන් යානා 3 ක් මිලට ගැනීම.
(viii) ගම්බද ප්‍රදේශවල ඇති අබලන් මාර්ග කොන්ක්‍රීට් යොදා ක්‍රමවත් කිරීම.

07. පහත දක්වෙන්නේ ප්‍රවාහන සේවාව උපකාරී කර ගැනීමට සිදුවන අවස්ථා 4 කි.

- ගංවතුරින් අනාථ වූ නැගෙනහිර ප්‍රදේශයේ ජනතාවට වියළි ආහාර බෙදාදීම.
- චීනයේ සිට දුම්රිය එන්ජින් 10 ක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම.
- හදිසි අවශ්‍යතාවයක් සඳහා ගාල්ල සිට කොළඹට යාම.
- යාපනයේ සිට ලූණු තොගයක් කොළඹට ගෙන්වා ගැනීම.

1. ඉහත එක් එක් කාර්යය සඳහා යොදා ගත හැකි විවිධ ප්‍රවාහන මාර්ග දක්වන්න.
2. එම මාර්ගවල ධාවනය වන මාධ්‍ය 2 බැගින් දක්වන්න.
3. අදාළ කාර්යය සඳහා ඔබ යෝජනා කරන වඩාත් සුදුසු ප්‍රවාහන මාධ්‍යය තෝරා, එසේ තෝරා ගැනීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න.

08. ප්‍රවාහන මූලිකාංගයක් වන මාධ්‍යය සඳහා නිදසුනක් දක්වෙන ප්‍රකාශය තෝරන්න.

1. දකුණු මුහුදුබඩ මාර්ගය බෙලිඅත්ත දක්වා දීර්ඝ කිරීම.
2. හම්බන්තොට දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම.
3. කොට්ටාව බහුවිධ ප්‍රවාහන සේවා මධ්‍යස්ථානය විවෘත කිරීම.
4. පොළොන්නරුව දුම්රිය ස්ථානය දක්වා සුඛෝපභෝගී අධිවේගී දුම්රියක් යෙදවීම.

(2019 O/L)

09. පහත X තීරුවේ ප්‍රවාහනය හා සම්බන්ධ සිදුවීම් කිහිපයක්ද, Y තීරුවේ ප්‍රවාහන මූලිකාංගද දක්වේ.

| X | Y |
|---|---|
| 1. 1990 ගිලන් රථ සේවාව දීප ව්‍යාප්තව පුළුල් කිරීම. | A - මාර්ගය |
| 2. උතුරු අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම. | B - මාධ්‍යය |
| 3. පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ නවීකරණය කිරීම. | C - බලය |
| 4. ලෝක වෙළඳපොලේ බොරතෙල් මිල අනුව ඉන්ධන මිල සංශෝධනය කිරීම. | D - පර්යන්තය |

ඉහත X තීරුවේ සඳහන් සිදුවීම් Y තීරුවේ සඳහන් ප්‍රවාහන මූලිකාංග සමග පිළිවෙලින් ගලපන ලද පිළිතුරු තෝරන්න.

1. A, B, D හා C  2. B, A, C හා D  3. B, A, D හා C  4. B, C, A හා D

(2018 O/L)

ධම්මික හෙට්ටිආරච්චි

(ලකුණු 02) (2018 O/L)

11. කොළඹ වරාය ප්‍රවාහන මූලිකාංගයක් වන ..............(1).............. වන අතර, කොළඹ වරායට පැමිණි නෙවෙස්කා ලේඩි (Neveska Lady) නෞකාව ප්‍රවාහන මූලිකාංගයක් වන ..............(2).............. වේ.

ඉහත ප්‍රකාශයේ (1) හා (2) යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

1. මාධ්‍යය, පර්යන්තය     2. පර්යන්තය, මාධ්‍යය
3. පර්යන්තය, බලය     4. මාර්ගය, මාධ්‍යය

(2017 O/L)

12. "කොළඹ වරාය පුළුල් කිරීම මගින් ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂම වේ."
ඉහත ප්‍රකාශයේ සඳහන් ප්‍රවාහනයට සෘජුවම සම්බන්ධ වන ප්‍රවාහන මූලිකාංගය නම්කරන්න.

(2017 O/L)

13. සුනිමල් දිනපතා පාසලට පැමිණෙන්නේ දුම්රියෙනි.

(අ) සුනිමල් පාසලට පැමිණීම සඳහා භාවිතා කරන ප්‍රවාහන ක්‍රමයට අදාළ එක් එක් ප්‍රවාහන මූලිකාංගය සඳහා නිදසුන බැගින් ලියන්න.

(ආ) ශ්‍රී ලංකාවේ දුම්රිය ප්‍රවාහන සේවය සපයන රාජ්‍ය අංශයේ ආයතනය නම්කරන්න.

(2016 O/L)

14. භාණ්ඩ ප්‍රවාහනය කරන විශාල නෞකාවකට අදාළ ප්‍රවාහන මූලිකාංග සඳහා නිදසුන් දක්වන පිළිතුර තෝරන්න.

1. වරාය, ගුවන් මාර්ග, ඩීසල්
2. ඩීසල්, වරාය, මහාමාර්ග
3. ජල මාර්ග, ගුවන් තොටුපොළ, ඩීසල්
4. ඩීසල්, ජල මාර්ග, වරාය

(2016 O/L)

15. ඉන්ධන පිරිමැසුම්දායක වාහනයක් වන දෙමුහුන් (Hybrid) මෝටර් රථ සඳහා වර්තමානයේ ඉහළ ඉල්ලුමක් පවතී. මෙම ප්‍රකාශය තුළ ඇතුළත්වන ප්‍රවාහන මූලිකාංග වන්නේ,

1. මාර්ගය හා මාධ්‍යයයි.     2. මාධ්‍යය හා බලයයි.
3. බලය හා පර්යන්තයයි.     3. මාර්ගය හා පර්යන්තයයි.

(2015 O/L)

ධම්මික හෙට්ටිආරච්චි